## ප්‍රස්තාවනාව

'චූලවංශය (80 සිට 90 දක්වා පරිච්ඡේද) හා එහි ඉතිහාසකරණ රටාව' යටතේ රචිත මෙම නිබන්ධය රුහුණු විශ්වවිද්‍යාලයේ දර්ශන පතිඋපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන්නකි.

මෙහි විෂය, චූලවංශයෙහි දෙ වැනි භාගය යනුවෙන් සම්ප්‍රදායානුකූලව සඳහන් වුව ද මා විසින් කරන ලද පර්යේෂණයෙහි ප්‍රතිඵලයක් වශයෙන් 80 සිට 90 දක්වා පරිච්ඡේද අඩංගු කොටස චූලවංශයෙහි තුන් වැනි භාගය ලෙස පැහැදිලි විය.

මෙම පර්යේෂණය ප්‍රධාන අංග දෙකකින් යුක්තය. එනම් චූලවංශයෙහි මෙම කාණ්ඩය පිළිබඳවත් එහි ඉතිහාසකරණ රටාව පිළිබඳවත්ය. මෙහිදී චූලවංශයෙහි මෙම කාණ්ඩය පිළිබඳ ඓතිහාසික ඇගයීමක් ද එහි ඉතිහාසකරණ රටාවේ මූලික ස්වරූපය පිළිබඳව ද සොයා බැලීමි. මේ හැර ලංකා ඉතිහාසකරණ රටාව හා මෙම කෘතියේ ඉතිහාසකරණ රටාව අතර සම්බන්ධතාවද පිරික්සුමට භාජනය විය.

මෙම පර්යේෂණ කාර්යයේ දී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර ඉවහල් කර ගත් අතර, විද්‍යාත්මක ඉතිහාසකරණය පිළිබඳ ලියවී ඇති විවිධ ශාස්ත්‍රීය ලිපි ලේඛණ බෙහෙවින් පිටිවහල් විය. එම ප්‍රකාශන සියල්ලක්ම මෙහි ඇති ග්‍රන්ථ නාමාවලියෙහි අඩංගු වේ. මෙම අධ්‍යයනයෙහි දී චූලවංශයෙහි මෙම කොටසේ ඇති ඓතිහාසික වටිනා කමත් එහි ඉතිහාසකරණ රටාවත් අපට පැහැදිලිය. මෙම අවධියෙහි ඉතිහාසය ගොඩනැංවීම සඳහා ඓතිහාසික මූලාශ්‍රයක් ලෙස චූලවංශය එක්තරා දුරකට වැදගත් මෙහෙයක් ඉටු කරයි. කරුණු ලබා ගැනීමත් අනෙක් මූලාශ්‍රවල සත්‍යාසත්‍යතාව ග්‍රහණය කර ගැනීමටත් මෙකල ඉතිහාසකරණයෙහි ස්වරූපය වටහා ගැනීමටත් ඉන් ලැබෙන පිටිවහල වැදගත්ය. එහි ඇති අඩු පාඩු හා දුර්වලකම් තේරුම් ගෙන විමර්ශණශීලීව පරිශීලනය කිරීමෙන් මෙහි වැදගත්කම වටහා ගත හැකිය.

18 - 1 - 1993

මෙම කෘතියෙහි ඉතිහාසකරණ ස්වරූපය මූලික ලෙස පැරණි වංශකථා රචනාවටම බොහෝ දුරට අනුකූල වන අතර, බුද්ධාගමේ ඉතිහාසය ලියා තැබීමත් සිංහල බෞද්ධ ස්වකීයතාවයට නැඹුරු වීමත් ඒ අතර ප්‍රධානය. මුල් වංශ කථාවල පැවැති බෞද්ධ ස්වකීයතාව පමණක් නොව මෙම අවධියෙහි ලක්දිව පැවති සිංහල හැඟීම පිළිබඳ අදහස් මෙම චූලවංශ කරුගේ මනස තුළින් ඉතිහාසකරණය තුළට පරාවර්තනය විය. ඒ හේතු කොට ශ්‍රී ලංකා ඉතිහාසකරණය වෙතට ජාති වාදී අදහස් ඇතුල්වීම මෙම කෘතියෙන් මනාව පැහැදිලි වේ.

පැරණි ලංකා ඉතිහාසයෙහි, බුද්ධාගමට හා භික්ෂූන්ට එම සමාජ ක්‍රමය විසින් උරුම කොට දුන් ස්ථානීය වැදගත්කම ගෙන හැර දැක්වීම අප කර්තෘවරයා ගේ මුඛ්‍යාර්ථය විය. ඒ සඳහා ලංකා වංශ කථා ඉතිහාසකරණ රචනාවේ ප්‍රධාන පරමාර්ථයක් වූ ඒකීය සිංහල-බෞද්ධ රාජ්‍ය සංකල්පය ගෙන හැර දැක්වීම ඔහුගේ මූලික තේමාව විය. එබැවින් භික්ෂූන්ගේ හා රජුන්ගේ ඉතිහාසය ලියා තැබීම ඉතිහාසකරණය යනුවෙන් ඔහු අදහස් කළ බව මෙම පර්යේෂණයෙන් පැහැදිලි ය. මේ අනුව ඉතිහාසකරණය ලෙස අප කර්තෘ වරයා ග්‍රහණය කලේ ඉතා සීමිත ක්ෂේත්‍රයකි. එසේ මුත් පැරණි ඉතිහාස රචනාවලින් අත්දැකීම් හා පුහුණුවක් ලැබූ මෙම කර්තෘවරයා පැරණි වංශකථාවල පැවැති අද්භූත හා ආශ්චර්යමත් සිදුවීම්වලින් ඉවත් වී තාත්වික කරුණු දැක්වීමට බොහෝ දුරට දැරූ උත්සාහය එබඳු කරුණු විරල වීමෙන් මැනවින් පැහැදිලිය. එය, මෙහි ලංකා ඉතිහාසකරණයේ විශේෂවූත් වැදගත් වූත් ලක්ෂණයක් ලෙස දැක්විය හැකිය.

මෙම පර්යේෂණ කාර්යයේදී විෂය ක්ෂේත්‍ර පිළිබඳවත්, පර්යේෂණ විධි ක්‍රම පිළිබඳ මත් මනා අවබෝධයක් ලබා දෙමින්, මා මුහුණ දුන් විවිධ ගැටලු ඉතා සරල ආකාරයෙන් විසඳා දෙමින් විද්‍යාත්මක ඉතිහාසකරණය පිළිබඳ වඩාත් නූතන හා ශාස්ත්‍රීය අදහස් උදහස් වලින් පෝෂණය කරමින් උපදෙස් දී මා දිරි ගැන් වූ රුහුණ විශ්වවිද්‍යාල යේ වැඩ බලන උපකුලපති, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨාධිපති හා ඉතිහාස හා සමාජවිද්‍යා අධ්‍යයනාංශ යේ මහාචාර්ය සිරිමල් රණවැල්ල මහත්මාට මාගේ කෘතඥතා පූර්වක ස්තූතිය පුද කරමි. මේ සඳහා එතුමන් ගේ වටිනා කාලය හා ශ්‍රමය කැප කිරීමේ ඵලය මෙම නිබන්ධනය ලෙස දැක්විය හැකි ය.

මෙම පර්යේෂණ මාතෘකාව මනා ලෙස සකස් කොට ඊට අදාළ උපදෙස් දෙමින් මා ඉදිරියට මෙහෙය වූ කොළඹ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ප්‍රෑන්ක් පෙරේරා මහත්මාටද, අවශ්‍ය උපදෙස් ලබා දෙමින් බෙහෙවින් උපකාර දක්වමින් මා ධෛර්යමත් කළ රුහුණ විශ්වවිද්‍යාලයේ ඉතිහාස හා සමාජ විද්‍යා අංශ ප්‍රධාන ආචාර්ය එම්.යූ ද සිල්වා මහත්මාට ද මාගේ කෘතඥතාව හිමි වේ. දුර්ලභ පොත් පත් සපයා දෙමින් මට අනුග්‍රහ දැක් වූ රුහුණ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශ ප්‍රධාන මහාචාර්ය වීනි විතාරණ මහත්මාටත්, එම අධ්‍යයනාංශයේ අගුලුගහ ධම්මින්ද හිමියන්ටත් ස්තුතිවන්ත වෙමි.

මෙම ශාස්ත්‍රීය කාර්යයේ දී මට ශක්තිය හා ධෛර්යය ලබා දෙමින් උනන්දු කල බෙහෙවින් උපකාර කළ රුහුණ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සරත් අමරසිංහ, දයානන්ද පටබැඳි, සෙනරත් ගමගේ, පී.හේවගේ, පී.බී. ඒකනායක , ජී.ඒ.වික්‍රමසිංහ, ඒ.කේ.පී.ජයසිංහ , පීනදාස දනන්සූරිය යන මහතුන්ට හා කුමාරි දත්තනාරායන මහත්මියට මාගේ කෘතඥතා පූර්වක ස්තුතිය පිරිනමමි.